1488

14 MAY 2018

මගේ අංකය - 010/10/03/01
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය,
හුරුළුවැව ව්‍යාපාරය,
ගලෙන්බිදුණුවැව,
2018.04.10

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත.

## 2018 - අප්‍රේල් මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව.

හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකාර ඊ.එම්.ඩබ්.කේ ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් අප්‍රේල් මස 05 වන දින පෙ.ව 9.30ට පමණ හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

පළමුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් පැමිණ සිටි සියලුම රාජ්‍ය නිළධාරින් හා ගොවි සංවිධාන නිළධාරින් පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

සහභාගි වූ රාජ්‍ය නිලධාරින්

| | | |
|---|---|---|
| 01 | ඊ.එම්.ඩබ්.කේ.ඒකනායක මහතා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු, හුරුළුවැව |
| 02 | එච්.එම්.අතුල විජේවර්ධන මහතා | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු , හුරුළුවැව |
| 03 | එච් එම් කුලතුංග මහතා | ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි,ග/බි වැව |
| 04 | පී එච් මොහොමඩ් මහතා | පරිපාලන ග්‍රාමනිලධාරි,ප්‍රා/ලේ කාර්යාලය,ග/බි වැව |
| 05 | ටී එම් සී එම් දිසානායක මහතා | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක,ග/බි වැව |
| 06 | පී ජී අමරසේන මහතා | ව්‍යාපෘති සැලසුම් නිලධාරි,දඹුල්ල |
| 07 | ජයවර්ධන තෙන්නකෝන් මහතා | කෘෂිකර්ම නිලධාරි |
| 08 | වයි ජී ඒ එස් ආරියරත්න මහතා | සංවර්ධන නිළධාරි, නේවාසික ව්‍යාපෘති කළ. කාර්යාලය |
| 09 | ඒ ඩී සිරිපාල මිය | සංවර්ධන සහකාර, නේවාසික ව්‍යාපෘති කළ. කාර්යාලය |
| 10 | ඩබ් ඒ ජී කේ ප්‍රියදර්ශනි මිය | සංවර්ධන නිළධාරි, නේවාසික ව්‍යාපෘති කළ. කාර්යාලය |
| 11 | කේ කබිලන් මහතා | ඉංජිනේරු සහකාර, වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය |
| 12 | එම් ඩී එම් ඩී නිශ්ශංක මහතා | ඉංජිනේරු සහකාර, වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය |
| 13 | එච් ඩබ් ආර් එච් කුමාරිහාමි මිය | ඉංජිනේරු සහකාර, වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය |
| 14 | කේ හේමරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 15 | ඩබ් එම් වීරසිංහ මහතා | වාරිමාර්ග ජලපාලක |
| 16 | ඩී එම් අබේපාල මහතා | වාරිමාර්ග ජලපාලක |
| 17 | ආර් එම් ඉලංගරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 18 | ඒ ධනපාල මහතා | වාරිමාර්ග ජලපාලක |
| 19 | ඩබ් ජී එන් එම් ප්‍රේමරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 20 | ජේ එම් එස් පී ජයසිංහ මහතා | වාරිමාර්ග ජලපාලක |
| 21 | ඩී එම් නිමල්රත්න බංඩාර | වාරිමාර්ග ජලපාලක |
| 22 | එච් එම් අබේරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 23 | ජේ එම් සුජිත් ප්‍රියංකර මහතා | වාරිමාර්ග ජලපාලක |
| 24 | ඩබ් එම් ගුණරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 25 | කේ ජී ඩබ් එම් අබේරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |

සහභාගි වූ ගොවි සංවිධාන නිලධාරීන්

| | | |
|---|---|---|
| 01 | ඩී කේ කාවින්ද අබේරත්න මහතා | සභාපති,ජනසිරිගම, ගොවි සංවිධානය |
| 02 | ආර් තිලකරත්න මහතා | ලේකම් ,කොකාවැව,ගොවි සංවිධානය |
| 03 | ඒ ඒ කුමාරසිංහ මහතා | සභාපති,සමගි ගොවි සංවිධානය |
| 04 | එස් එම් පියසේන මහතා | ලේකම්,යාය 05, ගොවි සංවිධානය |
| 05 | ආර් ඒ පී කේ රණවක මහතා | සභාපති,දුටුවැව ඩී 12-13, ගොවි සංවිධානය |
| 06 | කේ මද්දුම බංඩාර මහතා | යාය නියෝජිත,මරදන්කල්ල ගොවි සංවිධානය |
| 07 | ආර් එම් විලියම් සිංඤෝ මහතා | ලේකම්,රණමයුර, ගොවි සංවිධානය |
| 08 | එම් ගුණපාල මහතා | සභාපති,රණමයුර ගොවි සංවිධානය |
| 09 | වයි ජී සුමණ බංඩාර මහතා | භාණ්ඩාගාරික,දුටුවැව ඩී 12-13 ගොවි සංවිධානය |
| 10 | පී ටී ජයතිලක මහතා | ලේකම්,නිකවැව ඩී 05 ගොවි සංවිධානය |
| 11 | පී සුනිල් ප්‍රේමරත්න මහතා | ලේකම්,එකමුතු ගොවි සංවිධානය |
| 12 | එස් ඩබ් ජී එම් චින්තක උදයන්ත මහතා | භාණ්ඩාගාරික,ගැමුණු ගොවි සංවිධානය |
| 13 | ඩී එම් පියසේන මහතා | ලේකම,ගැමුණු ගොවි සංවිධානය |
| 14 | ඊ ඩී රණසිංහ මහතා | සභාපති,ඩී 05 නිකවැව ගොවි සංවිධානය |
| 15 | පී පුංචිබංඩා මහතා | භාණ්ඩාගාරික,යාය 05 ගොවි සංවිධානය |
| 16 | යූ බී ජයසේන මහතා | ලේකම්,ග/බි වැව ගොවි සංවිධානය |
| 17 | එන් කේ ජී ජයතිලක මහතා | ලේකම්,ඩී 06 නිකවැව ගොවි සංවිධානය |
| 18 | ජේ කරුණාරත්න මහතා | භාණ්ඩාගාරික,රණමයුර ගොවි සංවිධානය |
| 19 | ආර් එම් තිලකරත්න මහතා | භාණ්ඩාගාරක,ග/බි වැව ගොවි සංවිධානය |
| 20 | එච් එම් විමල් චන්ද්‍රසිරි මහතා | සභාපති,යාය 06 21 ගොවි සංවිධානය |
| 21 | සමන් මහතා | ලේකම්,සමගි ගොවි සංවිධානය |
| 22 | ආර් කේ ඩී ජයසිංහ මහතා | සභාපති,ග/බි වැව ගොවි සංවිධානය |
| 23 | එච් එම් පි සිරිපාල මහතා | සභාපති,යාය 05 ගොවි සංවිධානය |
| 24 | ඩබ් ඒ ජී ඒකනායක මහතා | සභාපති,මහසෙන් ගොවි සංවිධානය |
| 25 | ජී.ජී අබේරත්න මහතා | ලේකම්,රන්කෙත ගොවි සංවිධානය |
| 26 | එම් රණසිංහ මහතා | භාණ්ඩාගාරික,මරදන්කල්ල ගොවි සංවිධානය |
| 27 | එච් එම් කරුණාරත්න මහතා | සභාපති,ගැමුණු ගොවි සංවිධානය |
| 28 | අයි එම් එස් ඉලංගසිංහ මහතා | ලේකම්,මීගහපට්ටිය ගොවි සංවිධානය |
| 29 | එච් එම් එස් බංඩාර මහතා | භාණ්ඩාගාරික,දුටුවැව ඩී 11 ගොවි සංවිධානය |
| 30 | ඩබ් ජී සුනිල් ධර්මසිංහ මහතා | සභාපති,දුටුවැව ඩී 11 ගොවි සංවිධානය |

පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය හා එකගතා ලබා ගැනීම

පසුගිය වාර්තාව සමාලෝචනය කරන ලදී.

ලිපි ලැබීම්

ලිපි ඉදිරිපත් කර නොතිබුණි.

ආයතන සංවර්ධන කටයුතු - සංවර්ධන නිළධාරිනි - ඒ.ඩී.සිරිපාල මිය

(පසුගිය මස ප්‍රගතිය)

| කාරණය | ප්‍රගතිය | වෙනත් |
|---|---|---|
| කාරක සභා රැස්වීම් පැවැත්වීම | 11 | |
| මහසභා රැස්වීම් පැවැත්වීම | - | |
| නිළවරණ මහ සභා පැවැත්වීම | - | |
| මාසික මුදල් සාරාංශ වාර්තා සැකසීම | 19 | |
| විගණනය | 19 | |
| පුහුණු වැඩ සටහන් පැවැත්වීම | - | |

සිදු කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- ❖ අලුත් දිවුල්වැව ව්‍යාපාරයේ පෙර කන්න 2018.03.06 දින හා 2018.03.20 දින් කන්න රැස්වීම් පවත්වන ලදි.

- ❖ ගොවි සංවිධානයන්හි භාණ්ඩාගාරිකවරුන් හා ගණන් පරික්ෂක වරුන් ඇතුළු නිලධාරින් සඳහා 2018.03.27 දින මූල්‍ය කළමනාකරණ පුහුණුවක් පවත්වන ලදි.

ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත ආයතන සංවර්ධන කටයුතු

| කාරණය | ඉලක්ක | වගකීම |
|---|---|---|
| ගොවි සංවිධාන නිළවරණ පැවැත්වීම | - | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරි සංවර්ධන නිළධාරින් |
| කාරක සභා පැවැත්වීම | 20 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරි සංවර්ධන නිළධාරින් |
| මාසික මුදල් සාරාංශ සැකසීම | 20 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරි සංවර්ධන නිළධාරින් |
| පුහුණු වැඩසටහන්(නීතිමය බලතල ) | 01 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරි සංවර්ධන නිළධාරින් |
| විගණනය | 01 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරි සංවර්ධන නිළධාරින් |

වාරිමාර්ග කටයුතු - ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු අතුල විජේවර්ධන මහතා
**2018.04.05 දිනට ජලාශවල ජල තත්ත්වය**

| ජලාශය | උසින් අඩි | අක්කර අඩි |
|---|---|---|
| හුරුළු වැව | | 10575 |
| කිවුලේකඩ වැව | | 1747 |
| අලුත් දිවුල්වැව | | 3740 |

- ❖ 2017/18 මාස් කන්නය සඳහා වූ අවසන් ජලමුරය අප්‍රේල් මස 10 වන දින අවසන් වන බවත් .මේ වන විට දකුණු ඉවුර සඳහා ජලය නිකුත් කර ඇති අතර අගාවතේ ගොවි සංවිධාන සඳහා ජලය නිකුත් කර ඇති බව ප්‍රකාශ කරමින් වම් ඇළේ ජලය නිකුත් කිරිමේ දිනය පිළිබඳ ගොවි සංවිධාන නිලධාරින් සාකච්ඡා කර තිරණය කරන ලෙස ඉංජිනේරු මහතා දැනුවත් කරන ලදි.

- ❖ මේ වන විට වැවෙහි පවතින ජලය සම්පූර්ණ වගාවක් සඳහා ප්‍රමාණවත් නොවන බවත්,බෙත්මකට යාමද සුදුසු නොවන බවත් කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කලේය.

- ❖ අමතර ජල මුරයක අවශ්‍යතාවය ඇති බවට ජල පාලන කමිටුවේදි කරුණු ඉදිරිපත් වී ඇති අතර ඒ පිළිබඳව අදහස් විමසීමක් කරන ලදි.

- ❖ සංවිධාන නිලධාරින්ගේ අදහස් විමසීමෙන් අනතුරුව අමතර ජල මුරයක් ලබා දීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ විය.

- ❖ වම් ඇළ සඳහා ජල මුරයෙහි අවශ්‍යතාවය අප්‍රේල් 07 දින ඇළ විවෘත විය යුතු වන බවත් පෙර පරිදි මුලින්ම අගාවතේ ගොවි සංවිධාන සඳහා ජලය ලබා දී පසුව මුල් ගොවි සංවිධාන සඳහා ජලය නිකුත් කිරිම සුදුසු වන බව ගොවි සංවිධාන නිලධාරින්ගේ අදහස විය.

❖ මහවැලි ජලය ලබා ගැනීමේදී ඇති වන ගැටළු පිළිබඳව වාරිමාර්ග ඉංජිනේරු මහතා විසින් කරුණු පැහැදිලි කරන ලදී.

❖ මහවැලි ජලපාලන කමිටු රැස්වීමට පෙර අ/පුර පැවති රැස්වීමේදී ඉදිරි යල් කන්නය පිළිබඳව සාකච්ඡා කල පරිදි අතිරේක බෝග අක්කර - 8000 , වී අක්කර 2400 වගා කිරිම පිළිබඳව කරුණු ඉදිරිපත් කලේය.

❖ වගා ළිං 600ක රොන් මඩ ඉවත් කිරිම සඳහා මේ වන විට කටයුතු සූදානම් කර ඇති බවත් ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර අවසන් බවත් ප්‍රකාශ කලේය.

❖ ..වාරි අභිමානයයි ගොවි දිරියයි.. ගුවන් විදුලි ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පිළිබඳව අසහස් දක්වා එයට සහභාගි කරවීමට මෙම ව්‍යාපාර කමිටුවේදි ගොවි නායකයින් 06 දෙනෙක් නම් කර දෙන ලෙස නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා ප්‍රකාශ කර සිටියේය.ඒ අනුව පහත පරිදි නිලධාරින් නම් කෙරිනි.

| නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|
| 1.එස් එම් සමරකෝන් බංඩාර මහතා | භාණ්ඩාගාරික | දුටුවැව ඩී 11 |
| 2.එච් එම් කරුණාරත්න මහතා | සභාපති | ගැමුණු |
| 3.ඊ ඩී රණසිංහ මහතා | සභාපති | නිකවැව ඩී 05 |
| 4.එම් ජී සෝමසිරි මහතා | සභාපති | කොකාවැව |
| 5.කාවින්ද අබේරත්න මහතා | සභාපති | ජනසිරිගම |
| 6.උදේනි බංඩාර ඉලංගසිංහ මහතා | සභාපති | මරදන්කල්ල |

❖ පසු ගිය 2016/17 මාස් කන්නය බේරා ගැනීම සඳහා සිදු කල මෙහෙවර පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා පොතක් වශයෙන් තොරතුරු ලබා දෙන ලෙස වාරිමාර්ග ඉංජිනේරු මහතා දැනුවත් කල බව එතුමා ප්‍රකාශ කලේය. ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ගොවි සංවිධාන නිලධාරින්ගෙන් ඉල්ලීමක් කලේය.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | ඉටු කිරීමට ගත වන කාලය |
|---|---|---|---|---|
| ග/බි වැව ගොවි සංවිධාන සභාපති ආර් කේ ඩී ජයසිංහ මහතා | ඩී 08 - එෆ් සී 01 ඇළ කෘෂි මාර්ගය අබලන් වී තිබීම හා ඩී 08 ඇළහි නිර්මිත අබලන්ව පැවතීම පිළිබඳව හා ඩී 08 ඇළ හොරොව්ව මුලම පස් බැම්ම නොමැති වීම නිසා ජලය අපතේ යාම. | ඉදිරියේදි සදා දීමට කටයුතු කිරිම. | වාරිමාර්ග ඉංජිනේරු,සහකාර ඉංජිනේරු | - |

<u>ගොවි ජන සේවා කටයුතු-ග/බි වැව ප්‍රාදේශිය නිලධාරි කුලතුංග මහතා</u>

❖ 2018 යල් කන්නය සඳහා පොහොර ලබා දීමේ කටයුතු,පෙරදී පොහොර ලබා දුන් පරිදිම සිදු කෙරෙන බව දැනුවත් කලේය.

❖ පොහොර මිටියක මිල රු 500/= වශයෙන් වටිනාකමින් යුතු බවත් ප්‍රාදේශිය ගබඩාව උපුල්දෙණිය ගබඩාව වන බව හා පොහොර ගොවි සංවිධානය මගින් ප්‍රවාහනය කර ගත යුතු වන බව යන ... කරුණු පිළිබඳපැහැදිලි කිරිමක් කලේය.

❖ අලුතින් ලියා පදිංචි වන ගොවින් සඳහා ඉල්ලුම් පත්‍ර ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි.

❖ අතිරේක බෝග වගාව සඳහා පොහොර සහනාධාරය නොලැබෙන අතර මඩ ඉඩම් වල වගා කරන ගොඩ බෝග සඳහා හෙක්ටයාර් 1ක් සඳහා නිර්දේශිත පොහොර ප්‍රමාණයත්,සුළුවාරි,අහස් දියෙන් වගා කරන වගාවන් සඳහාත් වශයෙන් පැහැදිලි කරමින් නිර්දේශිත පොහොර ප්‍රමාණය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලදි.

- ❖ නිර්දේශිත සියළුම පොහොර ප්‍රමාණය ගොවියාට ලබා ගන්නා ලෙස දැනුවත් කලේය.
- ❖ ශ්‍රී මහ බෝධින් වහන්සේ අභියසදි අප්‍රෙල් 7,8 දෙදින අලුත් සහල් මංගල්‍ය සිදු කරන අතර ඒ සඳහා අදාළ ද්‍රව්‍යමය ආධාර සපයමින් දායකත්වය ලබා දුන් සැමට ස්තුති කරමින් එයට සහභාගි වන ලෙස ප්‍රාදේශිය නිලධාරි මහතා ඉල්ලීමක් කලේය.
- ❖ කන්නය ප්‍රමාද වී වගා කල ගොවින් සඳහා වගා හානි වලට නියමිත වන්දි ලබා නොදෙන බවත් දැනුවත් කරන ලදි.
- ❖ ගොවි ජන සේවා දෙපාර්ත මේන්තුවට අයත් කන්නිමඩුව වැව් රක්ෂිතය මැන වෙන් කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් මැනුම් නියෝගයක් ලබා ගනිමින් මිණුම් කටයුතු කල යුතු අතර රක්ෂිතය වෙන් කිරිමෙන් පසුව එය ආරක්ෂා කර ගැනීමට ගොවින් කටයුතු කල යුතු බවද ප්‍රකාශ කලේය.

<u>කෘෂි කර්ම කටයුතු - මූලස්ථාන කෘෂිකර්ම උපදේශක මහින්ද මහතා</u>

- ❖ කන්න 4ක කාලයක සිට බීජ නිෂ්පාදන කාර්යය කෙරෙන අතර, මයිලගස්වැව ගොවින්ගේ නිෂ්පාදිත බීජ ලේබල් සහිත සහතික බීජ වශයෙන් ගොවින් සඳහා ලබා දෙන බව කරුණු පැහැදිලි කරන ලදි.
- ❖ පසුගිය කන්නය පිළිබද සමාලෝචනයක් කරමින් සෝයා බීජ බෙදා දීම,එහිදි ඇති වූ ගැටළු හා මුහුණ දීමට සිදු වූ ගැටළු පිළිබඳව පැහැදිලි කරමින් දැනුවත් කිරිමක් සිදු කරන ලදි.
- ❖ ඉදිරියේදි සෝයා බීජ නොමිලේ ලබා නොදෙන අතර මිලදි ගැනීමට ගොවින්ට සිදු වන බව ප්‍රකාශ කලේය.
- ❖ බඩ ඉරිගු බීජ 50% දායකත්වය යටතේ ගොවි ජනසේවා දෙපාර්තමේන්තුව මැදිහත්ව කල හැකි බවද ප්‍රකාශ කලේය.

<u>මැද රට ගොවි සැලසුම් ඒකකය - දඹුල්ල</u>

- ❖ මෙම සමාගම 1994 සමාගම් පනත මගින් ලියා පදිංචි කර ඇති බව පැහැදිලි කලේය.
- ❖ මෙවර යල් කන්නයේදි ගොවින් දැනුවත් කර ලොකු ළුණු වගාවට අවතීර්ණ වීමට කටයුතු කිරිම කල යුතු බව දැනුවත් කරමින් ලොකුළුණු වගාව පිළිබඳව දීර්ග පැහැදිලි කිරිමක් කරන ලදි.
- ❖ ළුණු වගාවට අමතරව පොකුරු තල වගා කිරිම සිදු කෙරෙන බව ප්‍රකාශ කලේය.
- ❖ අලෙවිය සඳහා පහසුකම් සපයන අතර බීජ ලබා දීමේ කටයුතු හා ඉදිරි වෙළද ගිවිසුම් අනුව ඉදිරියට ගොවින් සමග ක්‍රියා කරන බව පැහැදිලි කරන ලදි.

<u>ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - පරිපාලන ග්‍රාම නිලධාරි මොහොමඩ් මහතා</u>

- ❖ ඉදිරි කන්නය කටයුතු කිරිමේදි සියළු දෙනාම එක්සත්ව කටයුතු කිරිම හොඳ බවත් අවශ්‍ය උපකාරයන් ලබා දෙන බවත් ප්‍රකාශ කලේය.

ගොවි සංවිධාන සඳහා නිළවරණ එකම කාලයකට සිදු කිරිමේ ක්‍රම වේදය පිළිබඳව එනම් ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා නිළවරණ මැයි මාසයේදිත් ,ජූනි මාසයේ සිට දෙසැම්බර් දක්වා නිළවරණ ජූනි මාසයේදිත් පැවැත් වීම පිළිබඳව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් ගොවි සංවිධාන නිලධාරින් හට නැවත වතාවක් කරුණු පැහැදිලි කරන ලදි. ඒ අනුව නිළවරණ පැවැත්වීම...

| ගොවි සංවිධානය | නිල කාලය අවසන් වන දිනය | නිළවරණය පැවැත්විය යුතු මාසය |
|---|---|---|
| උල්පත්ගම | 2018.01.27 | 2018 මැයි |
| ගලෙන්බිදුණුවැව | 2018.02.08 | 2018 මැයි |
| මරදන්කල්ල | 2018.02.24 | 2018 මැයි |
| දිවුල්වැව | 2018.02.29 | 2018 මැයි |
| නිකවැව ඩී 06 | 2018.06.10 | 2018 ජූනි |
| ජනසිරිගම | 2018.08.10 | 2018 ජූනි |
| නිකවැව ඩී 05 | 2018.08.25 | 2018 ජූනි |
| මීගහපට්ටිය | 2018.08.26 | 2018 ජූනි |
| දුටුවැව ඩී 11 | 2018.09.07 | 2018 ජූනි |
| උදාර | 2018.11.03 | 2018 ජූනි |
| ඒකාබද්ධ ගොවි සංවිධානය | 2018.09.08 | 2018 ජූනි |

න්‍යාය පත්‍රයට අනුව වෙනත් කරුණු සාකච්ඡා නොවූයෙන් ප:ව 1.00ට පමණ නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීමට පැමිණි සියලු දෙනාට නැවත ස්තුති කරමින් ව්‍යාපාර කමිටුව අවසන් කරන ලදී.

(මීලඟ ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම 2018.05.10ක දින පෙ:ව 9.30 ට)

ඊ.එම්.ඩබ්.කේ. ඒකනායක,
නේවාසික ව්‍යාපෘති කළමනාකරු,
හුරුළුවැව ව්‍යාපාරය.

පිටපත් -

1. අධ්‍යක්ෂ, වාරිකළමනාකරණ අංශය/කොළඹ - කා:දැ.ගැ.පි
2. දිස්ත්‍රික් ලේකම්, අ/පුර - කා:දැ.ගැ.පි
3. වාරිමාර්ග අධ්‍යක්ෂ, අ/පුර - කා:දැ.ගැ.පි
4. ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්, , අ/පුර - කා:දැ.ගැ.පි
5. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(අන්තර් පලාත්), අ/පුර - කා:දැ.ගැ.පි
6. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අ/පුර - කා:දැ.ගැ.පි